# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 13,027 — 1962 අප්‍රේල් 19 වැනි බ්‍රහස්පතින්ද — 1962.4.19**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදි)


## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් හාඟාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 629 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | — | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 627 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 628 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 632 |
| | | "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 151**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය:—

අංකය: ජේඒඒ. 45/48.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 අප්‍රේල් 16 වැනි දින සිට, මාතර මහෙස්ත්‍රාත් උසාවියේ අංක 70088 (ප්‍රාථමික) දරණ නඩුව අවසාන වන තුරු ඇහීමට හා තීන්දුව දීමට, මාතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා මාතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑස්සී. පීපී. 3/62.

එම්. ඒ. එම්. හුසේන් මහතා 1962 අප්‍රේල් 2 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, බදුල්ලේ දිස්ත්‍රික් නඩුකාර ධුරයට, බදුල්ල-හල්දුම්මුල්ල රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය: ජේඑස්සී. පීපී. 3/62.

එම්. ජමීල් මහතා 1962 අප්‍රේල් 2 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 42ඒ/55.

ඩී. පී. තිස්සංග මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා 1962 අප්‍රේල් 11 වැනි දින සිට 13 වැනි දින දක්වා, මාතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මාතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 42සී/54.

ජී. සී. නයිල්ස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා 1962 අප්‍රේල් 16 වැනි දින සිට 19 වැනි දින දක්වා, මාතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මාතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 27ඒ/57.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. අයි. ගුණරත්න මහතා 1962 අප්‍රේල් 11 වැනි හා 12 වැනි දිනයන්හි, ගම්පොල ක්‍රියා කරන පිණිස, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ගම්පොල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 27ඒ/61.

මොහොමඩ් හුසේන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. එම්. තහීර් මහතා 1962 මැයි 3 වැනි දින, ගාල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, ගාල්ලේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා ගාල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.


සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඞ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති නැතට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ශොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.

අංකය : ජේඑල්. 7ඒ/51.

ඒ. ඕ. එස්. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. පී. විජේතිලක මහතා 1962 අප්‍රේල් 13 වැනි දින සිට 23 වැනි දින දක්වා, මාතලේ ක්‍රියා කරන පිණිස, මහ නුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මාතලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඒඒ. 3/48.

සී. ජී. ද සිල්වා මහතා 1962 අප්‍රේල් 23 වැනි දින සිට, අවිස්සාවේල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 51536 දරණ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා අවිස්සාවේල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 8බී/57.

සී. ටී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. එන්. බර්තෝලමියුස් මහතා 1962 අප්‍රේල් 12 වැනි දින සිට 17 වැනි දින දක්වා, නුවරඑළියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා බදුල්ල-හල්දුම්මුල්ල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්/68බී/50.

ඩබ්ලිව්. ඒ. වෝල්වත් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. සී. කතිරවේලු මහතා 1962 අප්‍රේල් 9 වැනි දින සිට 25 වැනි දින දක්වා, යාපනේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, යාපනේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, කයිට්ස්, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා යාපනේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පිඑල්/එස්. 6/48.

ටී. එම්. මතියපරනාම් සහ වී. සෝමසුන්දරම් යන මහතුන් නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. වී. සේනාතිරාජා මහතා 1962 අප්‍රේල් 13 වැනි දින සිට 17 වැනි දින දක්වා හා 19 වැනි දින සිට 23 වැනි දින දක්වා, වවුනියාවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා වවුනියාවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පිඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සිමාම්පිල්ලේ මහතා 1962 අප්‍රේල් 13 වැනි, 14 වැනි, 22 වැනි 23 වැනි හා 24 වැනි දිනයන්හි, මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මන්නාරමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පිඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සීමාම්පිල්ලේ මහතා 1962 අප්‍රේල් 16 වැනි, 19 වැනි හා 23 වැනි දිනයන්හි, මන්නාරම් දිස්ත්‍රික්කයේ, මන්නාරම ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/එෆ්. 1/56.

ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. කරුණාරත්න මහතා 1962 අප්‍රේල් 9 වැනි දින සිට 11 වැනි දින දක්වා, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, කඩවත් සතරේ සහ වැලිගම් කෝරළේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඒඒ. 5/57.

ඒ. ජේ. සහීඩ් මහතා 1962 අප්‍රේල් 17 වැනි දින, වලගෙදර ගම්බද උසාවියේ අංක 3430 දරණ අපරාධ නඩුව ඇසීමට, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර සහ බටහිර පස්දුන් කෝරළයන්හි සහ කළුතර තොටමුනේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පිඑල්/ආර්. 1/48.

ආර්. පරමකුරු මහතා නැති අතර, සී. රාසයියා මහතා 1962 අප්‍රේල් 10 වැනි දින, යාපන දිස්ත්‍රික්කයේ, උතුරු හා නැගෙනහිර වලිකාමම්, වඩමරඩචි හා යාපනේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/පී. 6/51.

එස්. ජී. පීරිස් මහතා නැති අතර, ටී. ගුණසේකර මහතා 1962 අප්‍රේල් 6 වැනි දින, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා වැලිගම් කෝරළේ හා ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඒඒ. 37/57.

ඒ. බී. රත්නායක මහතා 1962 අප්‍රේල් 25 වැනි දින, ගිරිබාවය ගම්බද උසාවියේ අංක 1181 දරණ ඉල්ලුම් නඩුව ඇසීමට, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට හා වන්නිහත්පත්තුවේ, කටුගම්පොළහත්පත්තුවේ සහ ගිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පිඑල්/එන්. 3/59.

එම්. බී. කප්පාගොඩ මහතා නැති අතර, පී. එස්. මහාලේකම් මහතා 1962 මැයි 15 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ, පාත දුම්බර සහ උඩ දුම්බර ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/ඒ. 5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එච්. සිරිවර්ධන මහතා 1962 අප්‍රේල් 12 වැනි හා 13 වැනි දිනයන්හි, අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරළේ සහ පාත බුලත්ගම සහ ඇතුළුගම් සහ පනාවල් කෝරළයන්හි ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට හා බෙලිගල් සහ කුරුවිටි කෝරළයන්හි ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/පී. 7/56.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. බී. රත්නායක මහතා 1962 අප්‍රේල් 16 වැනි හා 17 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඩවිලි හත්පත්තුවේ සහ ගිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/එන්. 2/57.

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සභාපතිපිල්ලේ මහතා 1962 අප්‍රේල් 17 වැනි හා 18 වැනි දිනයන්හි, පේදුරුතුඩුව දිස්ත්‍රික්කයේ, තැන්මරඩචි, පච්චිලෙසිපල්ලෙයි-කරච්චි සහ පූනාකාරි-තුන්නුකායි ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 අප්‍රේල් 11 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායඝිලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ—12.

4-553

# වෙනත් පත්කිරීම් ආදිය

## ගැසට් නිවේදනයයි

1962 අංක 152

අංකය : ඒ. ජේ. 2/11/57.

අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

(1) ඩබ්ලිව්. එම්. ඩී. ඩී. විජේමාන්න මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්වයකරුවකු වශයෙන්ද,

(2) ජේ. ඒ. නයිදු මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්වයකරුවකු වශයෙන්ද,

පත්කර ඇත්තේ ය.

ජී. පී. ඒ. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962, අප්‍රේල් මස 12 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

4-586

1962 අංක 153

අංකය : ඊබී/ඒ-204.

අඹ නිරූපන ආඥාපනතේ දෙවන පරිච්ඡේදය 10 බී වැනි වගන්තිය යටතේ අංක 10,123 සහ වර්ෂ 1950 ජූලි මස 14 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද නිවේදනයෙන් තමන් වෙත පැවරී ඇති බලතල අනුව කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම් විසින් පහත සඳහන් පත්කිරීම් කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ:—

පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කය භාර වැඩ බලන ආණ්ඩුවේ ඒජන්ත, ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න මහතා, ස්වකීය රාජකාරි වලට අතිරේකව, 1962 මාර්තු මස 12 වැනි දින සිට, නැවත නියෝගයක් කරන තුරු, පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පිස්කල්.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර ආණ්ඩුවේ ඒජන්ත, ඒ. බී. ඇල්කඩුව මහතා, අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බලන කාලය තුල, ස්වකීය රාජකාරි වලට

අතිරේකව, 62.3.26 දින සිට 62.4.30 දක්වා හෝ නැවත නියෝගයක් කරන තුරු, උතුරු මැද පළාතේ පිස්කල් සහ අනුරාධපුරයේ බන්ධනාගාර අධිකාරී.

යාපනය පාලන දිස්ත්‍රික්කය භාර වැඩ බලන ආණ්ඩුවේ ඒජන්ත, වී. පී. විට්ටච්චි මහතා, සවකීය රාජකාරිවලට අතිරේකව, 1962 අප්‍රේල් මස 2 වැනි දින සිට, නැවත නියෝගයක් කරන තුරු, උතුරු පළාතේ පිස්කල්, යාපනය පාලන දිස්ත්‍රික්කයේ සහකාර රේගු අයකැමි, යාපනය පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන්, කැඩී බිඳී ගිය යාත්‍රා භාර ගන්නා නිලධාරී, සහ යාපනය, පේදුරුතුඩුව, වෙල්වැටිතුරේ සහ කන්කසන්තුරේ යන මේ ස්ථානවල පිහිටි එක් එක් බාහිර වරාය පිළිබඳ නියෝජ්‍ය මාස්ටර් ඇටෙන්ඩන්ට්.

ඇම්. ජේ. පෙරේරා,
ස්ථිර ලේකම් වෙනුවට.

1962 අප්‍රේල් මස 10 වැනි දින,
කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ 7.

4-571

---

1962 අංක 154

අංකය : ඊබී/ඒ-204.

අර්ථ නිරූපන ආඥාපණතේ දෙවන පරිච්ඡේදය 10 බී වැනි වගන්තිය යටතේ අංක 10,123 සහ වර්ෂ 1950 ජූලි මස 14 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද නිවේදනයෙන් තමන් වෙත පැවරී ඇති බලතල අනුව කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම් විසින් පහත සඳහන් පත්කිරීම් කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගාල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තතැනගේ විධානය පිට ක්‍රියා කරන එම දිස්ත්‍රික්කයේ වැඩ බලන සහකාර ආණ්ඩුවේ ඒජන්ත එල්. අයි. ජේ. සිල්වා මහතා, සවකීය රාජකාරි වලට අතිරේකව, 1962 මාර්තු මස 9 වැනි දින සිට ගාල්ල පාලන දිස්ත්‍රික්කයේ සහකාර රේගු අයකැමි සහ ගාල්ලේ අතිරේක බන්ධනාගාර අධිකාරී.

බදුල්ල පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැනගේ විධානය පිට ක්‍රියා කරන එම දිස්ත්‍රික්කයේ වැඩ බලන සහකාර ආණ්ඩුවේ ඒජන්ත, ඩී. නෝසයියා මහතා, සවකීය රාජකාරි වලට අතිරේකව, 1962 මාර්තු මස 9 වැනි දින සිට බදුල්ලේ අතිරේක සහකාර බන්ධනාගාර අධිකාරී.

ඇම්. ජේ. පෙරේරා,
ස්ථිර ලේකම් වෙනුවට.

1962 අප්‍රේල් මස 10 වැනි දින,
කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ 7.

4-572

---

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඞී.—ඞී 97/41.

ඕ. ඇන්. 1745.

### විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා

1948 අංක 13 දරණ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1934 පෙබරවාරි 5 වෙනි දින දරණ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන්හි 51 වෙනි වගන්තිය යටතේ වූ නිවේදනයයි.

ෆිලික්ස් ආර්. ඞී. බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1962 අප්‍රේල් 13 වැනි දින
කොළඹ දී ය.

**නිවේදනය**

කලින් කල සංශෝධිත 1934 පෙබරවාරි මස 5 වෙනි දින දරණ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා, 48 ඊ වෙනි වගන්තියට ඉක්බිති ව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන්, තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"48 එෆ් (1) මෙම ව්‍යවස්ථාවන්හි විරුද්ධ ව කුමක් සඳහන් වුවද, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විශේෂඥයකුගේ තත්ත්වයෙහි අර්ධකාල නිලධරයකු ලෙස කටයුතු කිරීමට කැමැත්ත දක්වූ එහෙත් ඉන් පසු 1962 ජනවාරි 1 වෙනි දින සිට ඒ දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ කාල සේවය ප්‍රතික්ෂෙප කළ, ඒ දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධරයකු විසින් 1961 දෙසැම්බර් 31 වෙනි දිනට පසු නොවූ දිනක සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වෙත ලිඛිත දැන්වීමක් මගින් සේවයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කර 1962 අප්‍රේල් 1 වෙනි දිනට පසු නොවූ දිනක ඒ විශ්‍රාම ගැනීම පිළිබඳ ව මාස තුනක දැන්වීමක් කර ඇතහොත්, ඔහු විශ්‍රාම ගනු ලබන කල්හි, අසනීපවීම හේතු කොට ගෙන ඔහු සේවයෙන් විශ්‍රාම ගත් විටෙක මේ ව්‍යවස්ථා යටතේ ඔහු වෙත ප්‍රදානය කළ හැකි ව තිබූ ප්‍රමාණයේ විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ඔහුට ප්‍රදානය කළ හැකි ය.

(2) ලංකා විශ්ව විද්‍යාලයේ සේවය සඳහා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සිට ද්විතීයනය කරනු ලැබූ අර්ධකාල වෛද්‍ය නිලධරයකුට ද මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය."

4-625

---

## 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනා ගමන පණත

### 21 ඒ (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගය

කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ අමාත්‍ය ධුරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, මට කලින් සිටි ඇමතිතුමකු විසින් 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 20 (1) වෙනි වගන්තිය යටතේ කරන ලදින් 1959 පෙබරවාරි මස 28 වෙනිදා 11,687 වෙනි අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ නියෝගය, මේ සමග ඇති උපලේඛනයෙහි දක්වා ඇති එක් දේපොළට සම්බන්ධවන තරමින්, 1961 තේ 22 වෙනි අංකය දරණ පණතෙන් සංශෝධිත 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 21 ඒ (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට මේ නියෝගයෙන්, 1962 මැයි මස 1 වෙනි දා සිට, අවලංගු කරමි.

ඇම්. පී. ද ඉසැඩ්. සිරිවර්ධන,
කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ
අමාත්‍ය තැන.

1962 අප්‍රියෙල් මස 10 වෙනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

| දේපොළවල් | පිහිටීම හා සෙසු විස්තර |
|---|---|
| 1. සීමාසහිත හයිලෙවල් රෝඩ් බස්රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපොළවල් | |
| (අ) ප්‍රමාණයෙන් රූඩ් 2 1/2 ක් පමණවූ පුවක්වත්ත නැමැති ඉඩම සහ ඉඩමේ පිහිටි සියලු ගොඩනැගිලි. | කළුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය නම් ගමේ උතුරට ප්‍රධාන පාරය, නැගෙනහිරට යහල්ලගේ කිරිනේරිස් සහ සෙස්සන්ට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටසය, දකුණට ඩබ්ලිව්. ඒ. දොන් ආගිරිස්ට සහ සෙස්සන්ට අයිති ඉඩමය, බස්නාහිරට මෙම ඉඩමේ ඉතිරි කොටසය යන යන මේ මායිම් ඇතුළත පිහිටා තිබේ. |
| (ආ) ප්‍රමාණයෙන් රූඩ් 1 ක් පමණවූ කලහලලන්ද නැමැති ඉඩම සහ එම ඉඩමේ පිහිටි සියලු ගොඩනැගිලි ... | කොළඹ දිස්ත්‍රික්කයේ පාදුක්ක නම් ගමේ සර්කියුලර් පාරේ පිහිටි වරිපණම් අංක 5 සහ 15 දරණ දේපළවල්ය, උතුරට ප්‍රධාන පාරය, නැගෙනහිරට සහ දකුණට මෙම ඉඩමේ ඉතිරි කොටස්ය, බස්නාහිරට පුද්ගලික පාරක්ය යන මේ මායිම් ඇතුළත පිහිටා තිබේ. |
| 2. සීමාසහිත රත්නපුර ඔම්නි බස්රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපළ | |
| ප්‍රමාණයෙන් අක්කරයක් පමණවූ ඉහළ වත්ත නැමැති ඉඩම සහ එහි පිහිටි සියලු ගොඩනැගිලි | කොළඹ දිස්ත්‍රික්කයේ රනාල නම් ගමේ උතුරට, ප්‍රධාන පාර; නැගෙනහිරට කේ. අන්නම්මාට සහ තවත් අයට අයිති දේපළය, දකුණට ඩී. ලිවේරාට සහ තවත් අයට අයිති දේපළය, බස්නාහිරට, ඇම්. ජෝන්ට සහ තවත් අයට අයිති දේපළය යන මේ මායිම් ඇතුළත පිහිටා තිබේ. |
| 3. සීමාසහිත කේ. එම්. ඩී. කේ බස්රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපළ | |
| ප්‍රමාණයෙන් අක්කරයක් පමණවූ කෝන්ගහමුල සහ බෝගහවත්ත යන ඉඩම හා එම ඉඩමේ පිහිටි සියලු ගොඩනැගිලි | මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල නම් ගමේ දඹුල්ල-ඇරාවුල පාර අද්දර පිහිටා තිබේ. |

| දේපොළවල් | පිහිටීම හා සෙසු විස්තර |
| --- | --- |
| 4. සීමාසහිත අයිලන්ඩ් බස්රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපළ. | |
| ප්‍රමාණයෙන් රූඩ් 3ක් පමණවූ කප්පල් කාරන් සීමාවුම් පෙයිය සීමාවුම් නැමැති ඉඩම සහ එහි පිහිටි සියලු ගොඩනැගිලි ... | යාපන දිස්ත්‍රික්කයේ බටහිර වේලනයි නම් ගමේ උතුරට ගම්සහා පටු පාරය, නැගෙනහිරට එස්. පොන්නප්පා තෝනාමහත්මියගේ දේපළය, දකුණට ප්‍රධාන පාරය, බස්නාහිරට ගම් සහා පටු පාරය යන මේ මායිම් ඇතුලත පිහිටා තිබේ. |

4-565/1

---

## 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනා ගමන පණත

### 21 ඒ (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගය

කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ අමාත්‍ය ධුරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, මට කලින් සිටි ඇමති තුමකු විසින් 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 20 (1) වෙනි වගන්තිය යටතේ කරන ලදින් 1960 අප්‍රියෙල් මස 29 වෙනි දා 12,119 වෙනි ගැසට් පත්‍රයෙහි පළවූ නියෝගය, මේ සමග ඇති උප ලේඛනයෙහි දක්වා ඇති දේපොළට සම්බන්ධවන තරමින් 1961 කේ 22 වෙනි අංකය දරණ පණතෙන් සංශෝධිත 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනා ගමන පණතේ 21 ඒ (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට මෙ නියෝගයෙන්, 1962 මැයි මස 1 වෙනිදා සිට අවලංගු කරමි.

ඇම්. පී. ද ඉසැඩ්. සිරිවර්ධන,
කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ
අමාත්‍ය තැන.

1962 අප්‍රියෙල් මස 10 වෙනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

| දේපොළවල් | පිහිටීම හා සෙසු විස්තර |
| --- | --- |
| 1. සීමාසහිත ශ්‍රී ලංකා බස්රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපළ. | |
| රූඩ් 3 ක් පමණ වර්ග ප්‍රමාණය ඇති උඩුපිටමූකලාන නැමැති ඉඩම. මෙහි වූ සියලු ගොඩනැගිලි සහිතවයි | කොළඹ දිස්ත්‍රික්කයේ මීගහ වත්ත නම් ගමේ උතුරට සහ නැගෙනහිරට ජී. ලීලානෝනා ගේ සහ ඇල්. ඊ. කබ්රාල් ගේ ඉඩමය, දකුණට මහ පාරය, බස්නාහිරට යූ. ඒ. පියසීලිට සහ තවත් අයට අයිති ඉඩමය යන මේ මායිම් තුළ පිහිටා තිබේ. |

4-565/2

---

ඇල්.ඩී.—බී 207/41.

## පඩි පාලක සභා ආඥාපනත

### 6 (2) වන වගන්තිය යටතේ නිවේදනය

මෙහි උපලේඛනයෙහි ඇති ආඥාව පඩි පාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 6 (1) වෙනි වගන්තිය යටතේ මවිසින් පනවා ඇති බව එකී පඩි පාලක සභා ආඥාපනතේ 6 (2) වෙනි වගන්තියේ විධිවිධාන අනුව මෙසින් නිවේදනය කරමි.

මේ ආඥාව 1962 මැයි මස 1 වෙනි දින සිට වලංගු විය යුතුය.

ඇම්. පී. ද ඉසැඩ්. සිරිවර්ධන,
කම්කරු හා ජනසතු සේවා ඇමති.

1962 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹදීය.

### උපලේඛනය

#### ආඥාව

පඩිපාලක සභා ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන මෙහි පහත සඳහන් කර්මාන්තයට අදාළ විය යුතුය :—

පහත දක්වෙන කවර එක් කාර්‍යයකින් හෝ කාර්‍යයන් ගණනාවකින් යුක්ත වූ නූල් කැටීමේ, රෙදි විවීමේ සහ (මේස් බෑනියම් ආදී භාණ්ඩ ඇතුළු) ඇඳුම් සෑදීමේ කර්මාන්තය, එනම් :

(i) කපු සහ අනිකුත් ද්‍රව්‍යවලින් නූල් කැටීම ;
(ii) නූල් වලින් රෙදි විවීම ; සහ
(iii) ඇඳුම් සහ මේස් බැනියම් ආදී භාණ්ඩ සෑදීම.

පහත දක්වෙන වැඩවල යෙදී සිටින කම්කරුවන්ගේ වැඩ ද ඊට ඇතුළත් :—

(අ) නූල් කැටීම—

1. ඇට සහිත කපු යන්ත්‍රවලට දමන්නෝ ;
2. ඇට සහිත කපු බෙදන්නෝ ;
3. කපු සුද්ධ කරණ යන්ත්‍රයට (ජින් යන්ත්‍රයට) කපු දමන්නෝ ;
4. සුද්ධ කරන ලද කපු එකතු කරන්නෝ ;
5. සුද්ධ කරන ලද කපු මළුවලට දමන්නෝ ;
6. කපු ඇට එකතු කරන්නෝ සහ මළුවලට දමන්නෝ ;
7. මිශ්‍ර කරන කම්කරුවෝ ;
8. කලවම් කරන යන්ත්‍ර (බ්ලෙන්ඩින් යන්ත්‍ර) පීඩර්වරු ;
9. ලැප්-එන්ඩ් පිසීවර්වරු ;
10. ලැප් කැරියර්වරු ;
11. කාඩ් ටෙන්ටර්වරු ;
12. තෙල් දමන්නෝ ;
13. ස්ට්‍රිපර්වරු;
14. ග්‍රයින්ඩර්වරු ;
15. ඩ්රෝ ෆ්‍රේම් fපීඩර්වරු ;
16. පීරන යන්ත්‍ර fපීඩර්වරු ;
17. ලැප් යන්ත්‍ර fපීඩර්වරු ;
18. පීරන යන්ත්‍ර ටෙන්ටර්වරු ;
19. ස්ලබින් යන්ත්‍ර ටෙන්ටර්වරු ;
20. ඉන්ටර් යන්ත්‍ර ටෙන්ටර්වරු ;
21. රෝවින් යන්ත්‍ර ටෙන්ටවර්රු ;
22. රෝවින් යන්ත්‍ර ඩෝfපර්වරු ;
23. තරළු (බොබින්) ගෙන යන්නෝ ;
24. රිං ස්පිනර්වරු ;
25. රිං ෆ්‍රේම් ඩෝfපර්වරු ;
26. බෑන්ඩර්වරු ;
27. නූල් ගෙනයන්නෝ ;
28. ඉද්දන් (ස්පින්ඩ්ල්) අලුත්වැඩියා කරන්නෝ ;
29. ඩොfපින් ජොබර්වරු ;
30. කානානම්වරු ;
31. අතුගාන්නෝ ;
32. හිස් තරළු ගෙනයන්නෝ ;
33. වීස් වයින්ඩර්වරු ;
34. වෙස්ට්කාඩ් ටෙන්ටර්වරු ;
35. වේස්ට් මියුල් ටෙන්ටර්වරු ;
36. ඩබ්ලර්වරු ;
37. නූල් බෙදා දෙන්නෝ ;
38. රීලින් (ඔතන) යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ ;
39. නූල් මිටි කරන්නෝ ;
40. නූල් කැටීමේ නියුක්ත වෙනත් කම්කරුවෝ.

(ආ) විවීම—

1. අමු නූල් ඔතන්නෝ ;
2. පාට නූල් ඔතන්නෝ ;
3. වේග යන්ත්‍රයෙන් නූල් ඔතන්නෝ ;
4. හරස් නූල් ඔතන්නෝ ;
5. නූල් ගෙන යන්නෝ ;
6. අතුගාන්නෝ ;
7. fපිටර්වරු ;
8. තෙල් යොදන්නෝ ;
9. නූල් කඳන් ("බීම්") ගෙන යන්නෝ ;
10. වාප්පු ඔතන්නෝ ;
11. බෑක් සයිසර්වරු ;
12. fප්‍රන්ට් සයිසර්වරු ;
13. නූල් අදින්නෝ ;
14. රීවර්වරු ;
15. "පර්න්" ඔතන්නෝ ;
16. වියන්නෝ නොහොත් පේස කාරයෝ ;
17. බලවේග රෙදි යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ ("ඔපරේටර්වරු") ;
18. ජොබර්වරු ;
19. පලුදු පිරික්සන්නෝ ;
20. මහන්නෝ ;
21. බූව දවන සහ කැඳ ඉවත් කරන යන්ත්‍ර සේවකයෝ ;
22. සෝදන යන්ත්‍ර (වොෂින් මැෂින්) ඇටෙන්ඩන්ට්වරු ;
23. "කියර" බොයිලේරුකරුවෝ ;

24. සායම් පොවන ටැංකි ඇටෙන්ඩන්ට්වරු ;
25. සායම් පොවන යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ ("ඔපරේටර්වරු") ;
26. රෙදි දිග හරින්නෝ ;
27. රෙදි වේලන යන්ත්‍ර සේවකයෝ ;
28. ඔප දමන යන්ත්‍ර සේවකයෝ ;
29. පළල අදින යන්ත්‍ර සේවකයෝ ;
30. "කැලැන්ඩර" කිරීමේ යන්ත්‍ර සේවකයෝ ;
31. රෙදි නවන යන්ත්‍ර සේවකයෝ ;
32. රෙදි නමන්නෝ ;
33. රෙදි නවන ස්ත්‍රීහු ;
34. මුද්‍රා යොදන සහ රෙදි මිටි බඳින සේවකයෝ ;
35. රෙදි මිටි පිරික්සන්නෝ ;
36. රෙදි මිටි තද කරන යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ ;
37. "ස්ක්‍රීන්" මුද්‍රණ සාදන්නෝ ;
38. "ස්ක්‍රීන්" මුද්‍රණ පරිපාලකයෝ ;
39. "ස්ක්‍රීන්" මුද්‍රණ කරුවෝ ;
40. සායම් පොවන සහ සුදු කරන යන්ත්‍ර සේවකයෝ ;
41. සායම් පොවන සහ සුදු කරන කම්කරුවෝ ;
42. සායම් පොවන සහ සුදු කරන ටැංකිවල වැඩකරන කම්කරුවෝ;
43. සායම් පොවන සහ සුදු කරන ටැංකි භාර කංකානම්වරු ;
44. බැංඩේජ් ඔතන ස්ත්‍රීහු ;
45. විවීමේ නියුක්ත වෙනත් කම්කරුවෝ.

(ඇ) මේස් බැනියම් භාණ්ඩ ඇතුළු ඇඳුම් සැදීම—

1. ප්‍රධානීන් නොහොත් අංශ භාර අය ;
2. ලේසින්-අවුට් මෙන් ;
3. ලේසින් ගර්ල්ස් ;
4. ලේසින් යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ ;
5. සැලසුම් කරුවෝ සහ ඇඳුම් කපන්නෝ ;
6. ඇඳුම් කපන්නෝ ;
7. කපන යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ ;
8. කපන්නෝ (අතින්) ;
9. විදුලි බලයෙන් ක්‍රියාකරන කටර් ක්‍රියා කරවන්නෝ ;
10. සන්නාලියෝ ;
11. මහන මැෂිම ක්‍රියා කරවන්නෝ ;
12. පිළියම් කරන ස්ත්‍රීහු ;
13. පිරික්සන ස්ත්‍රීහු ;
14. නවන ස්ත්‍රීහු ;
15. අනියම් වැඩකරන ස්ත්‍රීන් ;
16. අසුරන සහ බෙදන ස්ත්‍රීහු ;
17. මුද්‍රා තබන ස්ත්‍රීහු ;
18. කොලර් fපියුසින් යන්ත්‍ර ක්‍රියා කරන ලමයි ;
19. රෙදි මදින ස්ත්‍රීහු ;
20. කලිසන් නිම කරන ස්ත්‍රීහු ;
21. ස්ක්‍රීනින් කරන ස්ත්‍රීහු ;
22. සපත්තු ලේස්, පටි සාදන සහ වෙන් කරන යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ ;
23. ඔතන්නෝ (අතින්) ;
24. ඔතන්නෝ (යන්ත්‍ර මගින්) ;
25. වාප්පු ඔතන්නෝ ;
26. රෙදි පරීක්ෂා කරන්නෝ සහ වර්ග කරන්නෝ ;
27. පර්න් වයින්ඩර්වරු ;
28. වියන්නෝ සහ ගොතන්නෝ ;
29. ජොබර්වරු ;
30. අත් යන්ත්‍රයෙන් වියන්නෝ ;
31. මහන මැෂිම ක්‍රියා කරවන්නෝ ;
32. වර්නින් යන්ත්‍රය ක්‍රියා කරවන්නෝ ;
33. කියර් බොයිලර් ඔපරේටර්වරු ;
34. වාෂ්පයෙන් ක්‍රියා කරන බොයිලේරු ක්‍රියා කරවන්නෝ ;
35. රෙදිපිළි තැම්බීමේ නියුක්ත කම්කරුවෝ ;
36. සෝදන යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ ;
37. සායම් පොවන යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ ;
38. සුදු කරන්නෝ ;
39. මිරිකන යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ ;
40. වේලන යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ ;
41. "කැලැන්ඩර්" යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ ;
42. ස්ක්‍රීන් පින්ටර්වරු ;
43. කාන්තා ස්ක්‍රීන් පින්ටර්වරු ;
44. සහකාර ස්ක්‍රීන් පින්ටර්වරු ;
45. ට්‍රිම්කරණ ස්ත්‍රීහු ;
46. සෙලෆේන් මළු සහ කාඩ්බෝඩ් පෙට්ටි සාදන්නෝ ;
47. මදින ස්ත්‍රීහු ;
48. මදින්නෝ ;
49. ඉලෙක්ට්‍රික් ස්ත්‍රික්ක ක්‍රියා කරවන්නෝ ;
50. කටින්, ක්‍රීසින් සහ ස්කෝරින් යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ :
51. අලවන ස්ත්‍රීහු ;
52. අමුණන ස්ත්‍රීහු (අතින්) ;
53. අමුණන ස්ත්‍රීහු (යන්ත්‍ර මගින්) ;
54. මේස් බැණියම් භාණ්ඩ ඇතුළු ඇඳුම් සැදීමෙහි නියුක්ත වෙනත් කම්කරුවෝ.

එහෙත් පහත සඳහන් කම්කරුවන්ගේ වැඩ ඇතුළත් වන්නේය :—

(1) ලිපිකරුවෝ, කැෂියර්වරු, ගබඩාකරුවෝ, වේලා සටහන් කරුවෝ, මුරකරුවෝ සහ බලාගන්නෝ ;
(2) ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ රැක වරණ යටතේ පැවැත්වෙන, අත් යන්ත්‍ර හා බලවේග යන්ත්‍ර මාර්ගයෙන් රෙදි වියන කම්හල්වල නියුක්ත කම්කරුවෝ ;
(3) වර්ෂ 1945 නොවැම්බර් මස 2 වන දින අංක 9,481 දරන ගැසට් පත්‍රයේ පළවූ ආඥාවෙහි නියමිත මෝටර් රථ ගමනාගමන කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවෝ ; සහ
(4) වර්ෂ 1944 ජනවාරි මස 7 වන දින අංක 9,224 දරන ගැසට් පත්‍රයේ පළ වූ සහ අනතුරුව සංශෝධනය කරන ලද ආඥාවෙහි නියමිත ඉංජිනේරු කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවෝ.

4-562.

---

## 1952කෝ අංක 12 දරණ සෞඛ්‍ය සේවා පණත

### මහනුවර ආරෝග්‍යශාලා මණ්ඩලය

1952 කෝ අංක 12 දරණ සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1962 මාර්තු මස 30 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා ඩබ්ලිව්. ඒ. ජයවර්ධන මහතා මහනුවර ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ.,

එල්. එස්. බී. පෙරේරා,
සචිර ලේකම්.

1962 මාර්තු මස 30 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

4-578

---

## 1961 අංක 62 දරණ වෙළඳුන්හට බලපත්‍ර නිකුත් කිරීමේ පනත

### 4(7) දරණ වගන්තිය යටතේ නිවේදනය

1961 අංක 62 දරණ වෙළඳුන්හට බලපත්‍ර නිකුත් කිරීමේ පනත යටතේ වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමතිතුමා පැනවූ පහත සඳහන් නියෝග සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය අනුමත කර තිබෙන බව මෙයින් නිවේදනය කෙරේ :—

(1) වෙළඳුන්හට බලපත්‍ර නිකුත් කිරීමේ 1961 (අංක 1) නියෝග සංශෝධනය කරමින්., 1961 ඔක්තෝබර් 16 වැනි දින අංක 12,721 දරණ, අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිඬ කළ නියෝගය.
(2) 1961 අංක 62 දරණ වෙළඳුන්හට බලපත්‍ර නිකුත් කිරීමේ පනතේ 2 වෙනි වගන්තියේ බලපැමෙන් සමහර තැනැත්තන් නිදහස් කරමින් 1961 ඔක්තෝබර් 16 වැනි දින අංක 12,721 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ නියෝගය.
(3) වෙළඳුන්හට බලපත්‍ර නිකුත් කිරීමේ 1961 (අංක 1) නියෝග සංශෝධනය කරමින්, 1961 ඔක්තෝබර් 20 වැනි දින අංක 12,728 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිඬ කළ නියෝගය.
(4) වෙළඳුන්හට බලපත්‍ර නිකුත් කිරීමේ 1961 (අංක 1) නියෝග සංශෝධනය කරමින් 1962 පෙබරවාරි 10 වැනි දින අංක 12,932 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිඬ කළ නියෝගය.

එච්. ඊ. තෙන්නකෝන්.
අතිරේක සචිර ලේකම්,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ
අමාත්‍යාංශය.

1962 අප්‍රේල් 10 වෙනි දින.
කොළඹ 3 දීය.

4-520

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙසින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 අප්‍රේල් 4 දාය,
කොළඹ 2.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මුදලි තුමාගේ කොට්ඨාශයේ, කොළඹ නගර සභා සීමාව තුළ හැව්ලොක් පාරේ වරිපනම් අංක 146 දරණ අක්කර 2 3/4 ක් පමණ වන පහත සඳහන් පරිදි මායිම් ඇති ඉඩම් කොටස :—

උතුරට : වරිපනම් අංක 64, 66/2, වජිරා පාර සහ අංක 138/4, 138/3, 138/2, 138/1, 138, සහ 144 හැව්ලොක් පාර ; නැගෙනහිරට : හැව්ලොක් පාර සහ වරිපනම් අංක 144, 154/1, හැව්ලොක් පාර, වරිපනම අංක 20, 21, අඹගහවත්ත ; දකුණට : වරිපනම් අංක 26, 28, 23, ඇන්ඩර්සන් පාර සහ අංක 18, ද පොන්සේකා පාර ; බස්නාහිරට : වරිපනම් අංක 18, 20, 22, 24, ද පොන්සේකා පාර සහ වරිපනම අංක 64, වජිරා පාර.

4-560

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

මගේ අංකය : නීති/ණ/13.

### ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයන් යටතේ අංක 401 දරණ ජාතික නිවාස පනතේ 76 වැනි ඡේදය අනුව උකස් කරනු ලැබූ ඉඩම විකිණීම සඳහා බලය දීම

ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයන් යටතේ අංක 401 දරණ ජාතික නිවාස ආඥා පනතේ අංක 9(1) (බී) දරණ වගන්තිය යටතේ පත් කරනු ලැබූ ජාතික නිවාස සහකාර කොමසාරිස් නැත්පත් ධනපාල සිරිසේන වීරසිංහ වන මම ලංකාණ්ඩුව සඳහා සහ වෙනුවෙන් ක්‍රියා කරමින් පානදුරේ ඇල්. ඇස්. ප්‍රනාන්දු ප්‍රසිඩ නොතාරිස් තැන විසින් 1956 පෙබරවාරි 1 වැනි දින අංක 1461 දරණ උකස්කරය යටතේ මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් පානදුර ගල්තුඩෙ, මොරටුවත්තේ පදිංචි තුප්පහීගේ දොන් චන්ද්‍රසේනගෙන් 1961 සැප්තැම්බර් 30 වැනි දිනතෙක් අයවිය යුතු රුපියල් විසිඑක්දහස් දෙසිය හැත්තෑ තුනයි ශත හැත්තෑහත (රු. 21,273.77) අයකර ගැණීම සඳහාත්, එසේම 1961 සැප්තැම්බර් 30 වෙනි දින සිට විකිණීම පැවැත්වෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තව දුරටත් වූ රුපියල් දහසය දහස් පනස් හයයි ශත හතලිහ (රු. 16,056.40) ක මුදලක් සම්බන්ධයෙන් වන පොළී මුදල වර්ෂයකට සියයට තුනේ ප්‍රමාණයට යථෝක්ත උකස්කර ප්‍රකාර 1961 සැප්තැම්බර් 30 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් එකතුවන සියළුම දඩ මුදල් සමග අයකර ගැණීමත් එසේ අයකර ගැණීමේදී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු අයකර ගැනීම සඳහාත්, මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ඉඩම සහ එයට අදාල සියළු දේත් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිණිස ආඥා තිකුත් කර එසේ විකිණීම සඳහා කොළම 12, බෙල්මන්ඩ් වීදියේ අංක 7 දරණ ස්ථානයේ කේ. ජී. එඩ්මන්ඩ් ප්‍රසිද්ධ වෙණ්දේසිකරුට බලය දෙමි.

ධනපාල වීරසිංහ,
ජාතික නිවාස සහකාර කොමසාරිස් තැන.

1962 මාර්තු ... දින,
කොළඹ 2.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පානදුර බැද්දේ වලාන ග්‍රාමයෙහි පිහිටි 1950 ජූලි 12 වැනි දින ෂෙල්ටන් ඩබ්ලිව්. පීරිස් මිනින්දෝරු තැන විසින් සකස් කරණ ලද අංක 374 දරණ පිඹුර පරිදි හා බී. 373/107 දරණ අංකය යටතේ ලියාපදිංචි කරණ ලද කහටගහවත්ත, අඹගහවත්ත, මහවත්ත අප්පුකුට්ටිගෙවත්ත, පරංගියාවත්ත සහ ගොන්නගහවත්ත යන නම්වලින් යුත්. උතුරට ආචාර්ය ජී. පී. මලලසේකර මහතාට අයිති අප්පුකුට්ටිගෙවත්තද, නැගෙනහිරට හා දකුණට ප්‍රථමයෙන් මේ ඉඩම හා ඒකාබද්ධව පැවති ඉඩමකින්ද, බස්නාහිරට පරණ පාරද මායිම්ව පවතින ප්‍රමාණයෙන් රූඩ් එකක්වූ එහි ඇති සියළු දේත් සහිත බෙදා වෙන්කළ ඉඩම් කැබැල්ල බී. 365/10 දරණ අංකය යටතේ ලියාපදිංචි කරණ ලද වලාන පාරේ වරිපණම් අංක 12 දරණ ඉහත සඳහන් නම්වලින්ම යුත් ඉඩමට, උතුරට ආචාර්ය ජී. පී. මලලසේකර මහතාට අයිති අප්පුකුට්ටිගෙවත්ත, ශ්‍රී විජය සෞගත විද්‍යාල භූමිය, එච්. රොමානිස් ප්‍රනාන්දු, ඇම්. සයිමන් කුරේ සහ හෙන්දිරික් පෙරේරා යන අයට අයිති කහටගහවත්තද, නැගෙනහිරට එච්. හෙන්දිරික් පීරිස් සහ එච්. රොමානිස් ප්‍රනාන්දුට අයිති කහටගහවත්ත සහ මිනුවන්පිටිය සුසාන භූමියද, දකුණට අංක 2 දරණ ඉඩම් කොටසද, බස්නාහිරට ගොරකපොල සිට පානදුර දක්වාවූ මායිමද මායිම්ව පවතින ප්‍රමාණයෙන් අක්කර දෙකයි, රූඩ් තුනයි, පර්චස් දහ අටකින් යුත් ඉඩමේ කොටසකි.

4-518

---

## වන්දනා ගමන් ආඥා පනත

1960 ජූනි මස 3 වැනි දින, අංක 12,139 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ද, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ද, පළ කරන ලද ප්‍රකාශයෙන් සංශෝධිත වන්දනා ගමන් ආඥා පණත (133 වැනි පරිච්ඡේදය) යටතේ, අනුරාධපුර පූජනීය නගරය සම්බන්ධව පනවන ලද රෙගුලාසිවල, 3 වැනි රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි.

1962 වෙසක් වන්දනා වාරය 1962 මැයි මස 17 වැනි දින ආරම්භ වී 1962 මැයි මස 19 වැනි දින අවසන් වන බව, සාමාන්‍ය දැනගැනීම සඳහා මෙසින් දැනුම් දෙමි.

නිශ්ශංක විජයරත්න,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සභාපති.

1962 අප්‍රේල් මස 7 වැනි දින,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ දීය.

4-524

---

## ලංකා දුම්රිය සේවය

### දුම්රිය මාර්ගය හරහා මහා මාර්ගය වැටී ඇති ස්ථාන අළුත්වැඩියා කිරීම

කැලණිවැලි දුම්රිය මාර්ගයේ මාලපල්ල සහ හෝමාගම දුම්රිය ස්ථාන අතර සැ. 14 ද. 47, පුරුක් 26 දරණ ස්ථානයේ පිහිටි ගලවිල මහා මාර්ගයේ දුම්රිය හරස් පාර මෙම අප්‍රියෙල් මස 21 වැනි සෙනසුරාදා රාත්‍රී 6 සිට පසු දින ඉරිදා උදය 6 දක්වා අළුත්වැඩියා කරණ බැවින් මෙම කාලසීමාව තුළදී සියලුම රථ වාහන හෝමාගම මංසන්ධියේ සිට හයි ලෙවල් පාර හරහා රෝහල් මාර්ගයෙන් ගමන්කළ යුතුය.

4-359

ලංකාවේ වැලව්වෙත්තෙයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි